# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2361/33 – 2023 දෙසැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා – 2023.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපළාත නැගෙනහිර කෝරළයේ සුළු කොට්ඨාසයේ ගලගෙදර බටහිර (301) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මොරවද්දෙණිය (අ.ග.පි. 129 තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/TMP/2019/386 හා 2019.11.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'සී' – ඔයගාව අස්වැද්දුම – ප්‍රමාණය: හෙක්. 0.0523**

උතුරට: අ.ග.පි. 129 හි කැබලි අංක 93, 98, 72 සහ 69; නැගෙනහිරට: කැබලි අක්ෂර ඩී සහ අ.ග.පි. 131 (ගලගෙදර); දකුණට: අ.ග.පි. 131 (ගලගෙදර), මහින්ද බණ්ඩාර සහ තවත් අය හිමිකම් කියන ඔයගාව අස්වැද්දුම; බටහිරට: කොස්පොතු ඔය, කැබලි අක්ෂර ඒ, බී සහ අ.ග.පි. 129 හි කැබලි අංක 93.

02. **කැබලි අක්ෂර 'ඩී' – අස්වැද්දුම සහ බෝගහලන්දේකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0068**

උතුරට: අ.ග.පි. 129 හි කැබලි අංක 69; නැගෙනහිරට: අ.ග.පි. 131 (ගලගෙදර); දකුණට: අ.ග.පි. 131 (ගලගෙදර); බටහිරට: අ.ග.පි. 131 (ගලගෙදර), කැබලි අක්ෂර සී සහ අ.ග.පි. 129 හි කැබලි අංක 72.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/7/2019/HW/16.
2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 - 0077

1A – G 040617 – 14 (2023/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*